# භික්ෂුව සහ රජය අතර සබැඳියාව
## (පොළොන්නරු යුගයේ සිට මහනුවර යුගය දක්වා)

**වටරක්ගොඩ සුමන හිමි**

## මධ්‍යකාලීන යුගයේ භික්ෂුව, රජය හා සමාජය

ක්‍රි.ව. 10 වන සියවසයේ අග සහ 11වන සියවසයේ මුල් භාගයේ ශ්‍රී ලංකාවට එල්ල වූ චෝල ආක්‍රමණයන් හේතුවෙන් දේශපාලන, ආර්ථික, අගමික යන සෑම අංශයකම අවනතියක් සනිටුහන් වන ආකාරය හඳුනාගත හැකිය. මෙකී අවනති තත්ත්වයෙන් යළි රට සුඛිත මුදිත කරවනු ලබන්නේ පළමුවෙනි විජයබාහු රජතුමා විසිනි (ක්‍රි.ව. 1055-1110). විනාශ වී තිබූ සියලු සංස්ථාවන් නඟා සිටුවීමේ කාර්යය ඉටුකිරීම සඳහා ප්‍රබල උත්සාහයක් ගත් විජයබාහු රජු බුරුම දේශයේ අනුරුද්ධ රජුගේ උපකාර ඇතිව ශ්‍රී ලංකාවෙන් තුරන්ව තිබූ උපසම්පදාව යළි පිහිටුවීමට කටයුතු කළේය.[1] එසේම ත්‍රිපිටක ග්‍රන්ථ රචනා කරවා භික්ෂූන් වහන්සේලා අතර බෙදා හරින ලද බව ද වංසකතාව පෙන්වා දෙයි.[2] එමෙන්ම ශාසනික කාර්යාවලීන් ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා එකල අනුරාධපුරයේ තිබූ ප්‍රධාන මූළායතනයන්හි මූලස්ථාන ද පොළොන්නරුව කේන්ද්‍ර කොට ගනිමින් පිහිටුවන ලදි. ජරාවාසව පැවැති නාගදීපයේ ජම්බුකෝළ විහාරය, මණ්ඩල ගිරි විහාරය, අනුරාධපුරයේ මහා බෝධිවිහාරය ආදී වෙහෙර විහාර රාශියක් ද ප්‍රතිසංස්කරණය කරවීය. මෙබඳු ආකාරයෙන් අනුග්‍රහයන් දක්වමින් අක්‍රීයව තිබූ සසුන යළි සක්‍රීය කිරීම සඳහා විජයබාහු රජු ප්‍රයත්න දැරුව ද එතුමාගේ අභාවයෙන් පසුව යළිත් භික්ෂු ශාසනය අවනතිය කරා යොමුවන්නට විය. විජයබාහු රජුගෙන් පසුව සිහසුනට පත් ඇතැම් පාලක පිරිස් ශාසනික දේපල පවා කොල්ලකෑ බවට සාක්ෂි වංසකතාවන්හි අන්තර්ගතව තිබේ.[3] මෙකල රජ වූ වික්‍රමබාහු හා මානාභරණ යන රජුන්ගේ ක්‍රියාකලාපයන් උක්ත සාධකයට නිදසුන් ලෙස පෙන්වාදිය හැකිය.

රාජ්‍ය බලපෑම අවම වීම සමගින් ව්‍යසනකාරී තත්ත්වයනට මුහුණ දුන් සංඝ සංස්ථාව යළි නඟා සිටුවනු ලබන්නේ පළමු පරාක්‍රමබාහු රජු විසිනි (ක්‍රි.ව. 1153- 1186). මෙකල සංඝ සංස්ථාවේ පැවැති අර්බුදකාරී ස්වරූපය මහාවංසය දක්වන්නේ ''සංඝයා වෙත පවරන ලද ගම්වල අඹුදරුවන් පෝෂණය කිරීම ශීලය විය. එයින් බැහැර අනෙක් ශීලයක් ඔවුන් වෙත නොවීය. එකමුතුව විනය කර්මයන් සිදු කිරීම පසෙක තිබියදී පැවිදිකම ආරක්ෂා කළ භික්ෂූන් පවා ඔවුනොවුන් නුරුස්සන්නට විය''[4] තත්කාලීන සංඝ සංස්ථාවේ ස්වරූපය පිළිබඳ අවබෝධයක් ලබාගැන්මට මෙම තොරතුරම ප්‍රමාණවත් වේ. මෙම තත්ත්වය යටතේ සසුනෙහි ඉදිරි පැවැත්ම උදෙසා ශාසන ශෝධනයක් සිදු කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් විය. මෙසේ ශාසන ශෝධනයක් සිදු කිරීමට පරාක්‍රමබාහු මෙහෙය වන ලද්දේ ශ්‍රමණ ප්‍රතිරූපකයන් සසුන කෙලසමින් පැවැතීම සහ දූර්මත පැතිරයාම යන කාරණා දෙක පදනම් කරගෙනයැයි පෙන්වා දෙයි.[5]

පරාක්‍රමබාහු රජුගේ මෙකී ශාසන ශෝධන ක්‍රියාවලිය සඳහා නායකත්වය සැපයීම සඳහා උදුම්බර ගිරිවැසි මහා කාශ්‍යප හිමියන්ට පැවරුණි.[6] වංසකතාව පෙන්වා දෙන්නේ අනුරාධපුරයේ ඥානපාල තෙරුන් හා උන්වහන්සේගේ ශිෂ්‍යයන්, සබරගමුවේ තෙරුන් වහන්සේලා කිහිපනමක්, නාගින්ද පල්ලියේ මොග්ගල්ලාන තෙරුන් ඇතුළු සේලාන්තර වෙහෙර වැසි නන්ද තෙරුන් ප්‍රමුඛ රෝහණ වැසි තුන් නිකායට අයත් භික්ෂූ පිරිසක් ද මේ සංගායනා සඳහා සම්බන්ධ වී ඇති බවය.[7]

මෙම භික්ෂූන් වහන්සේලාගේ සහභාගීත්වයෙන් කරන ලද සංඝ සංශෝධනයෙන් පසුව සසුනේ පැවැත්ම තහවුරු කිරීම පිණිස ගල්විහාර භූමියේ පේළි පනස් එකකින් යුත් කතිකාවතක් ද පරාක්‍රමබාහු රජු විසින් ගල්විහාරයේ පර්වත බිත්තියේ කොටවන ලදී. මෙම කතිකාවතේ අන්තර්ගත කරුණු ප්‍රධාන තේමා තුනක් යටතේ දැක්විය හැකිය. පළමු කොටසින් ඓතිහාසික විස්තරයක් ද දෙවන කොටසින් සත් විස්සක් ඇති ව්‍යවස්ථාවක් හා තෙවැනි කොටසින් ඇතුළු ගමට පිවිසීම සම්බන්ධව අනුගමනය කළයුතු කරුණුත් යනාදී වශයෙනි.

මෙලෙසින් සංඝ සංශෝධන සිදු කරමින් කතිකාවතක් පිහිටවමින් පොළොන්නරු යුගයේ සසුන නඟාසිටුවීමට කටයුතු කළ ද එකී කටයුත්තේ ප්‍රතිඵල කෙතෙක් කාලයක් පැවැතිය ද යන ගැටලුව මතුවන්නේ නිශ්ශංකමල්ල රජු (1187-1196) විසින් ස්වකීය අභිලේඛනයන් තුළ තමා විසින් ශාසන ශෝධනයක් කළ බව දැක්වීම හේතුවෙනි. නිශ්ශංකමල්ලයන්ගේ අභිලේඛනයේ දැක්වෙන්නේ ''දුස්ශීලයන් හා මහණකම එපා වූවන් ද ලාබ සත්කාරයේ ගිජු කමින් හා ගිහියන් වීමෙන් පසු රජයට යුතුකම් කෙරෙහි බියෙන් ද බෞද්ධ ශ්‍රමණභාවයෙන් ඉවත් නොවෙනු දැක ශාසනය කිළිටි නොකොට සිය කැමැත්තෙන් සිවුරු හැරයන්නවුන්ට එවැනි රාජකාරි කිරීමට නොලැබෙන අතර රන් සහ වස්ත්‍ර යනාදිය ලබාදෙන බව ද ප්‍රකට කරවීය''[8] යනුවෙනි. මෙම ලිපියට අනුව නිශ්ශංකමල්ල රජු ශාසනය පවිත්‍ර කොට ඇත. මෙකී ශෝධනයෙන් පසුව එතුමා විසින් සංඝයාගේ යහපැවැත්ම උදෙසා ඉවහල් වන ව්‍යවස්ථා මාලාවක් ද පනවා තිබේ.[9]

පොළොන්නරු යුගයේ සංඝ සංස්ථාවේ ක්‍රියාකාරීත්වය කෙබඳු තත්ත්වයක පැවතියේද යන්න පිළිබඳ නිරවුල් අවබෝධයක් ලබා ගැනීමට පූර්ව කරුණු ප්‍රමාණාත්මක වනු ඇත. අනුරපුර යුගයට සාපේක්ෂව බලන කළ පොළොන්නරු යුගයේ රාජ්‍යය සාමකාමීව පාලනය කළ රජවරු, භික්ෂූන් වහන්සේගේ පැවැත්ම සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමුකරමින් ඒ සඳහා විශේෂ ක්‍රියාමාර්ග අනුගමනය කර තිබීම මෙම යුගයේ කැපී පෙනෙන ලක්ෂණයක් ලෙස හඳුනාගත හැකිය.

චෝළ ආක්‍රමණ හේතුවෙන් ලාංකේය අගනගරය අනුරාධපුරයේ සිට පොළොන්නරුවට විතැන් වූවා සේම දහතුන්වන ශතවර්ෂයේ දේශීය රජවරුන් අතර ඇති වූ අර්බුද හා කාලිංග මාඝ ආක්‍රමණය හේතුවෙන් පොළොන්නරු අගනගරය විසින් දඹදෙණිය වෙත අගනගර යන නාමය ලබාදෙන ලදි. මෙකී කාර්යය පසුපස සිටියේ මලය දේශයෙන් බිහිව විජාතික බලවේගයන් පලවා හැර දඹදෙණිය අගනගරය කර ගත් තුන්වන විජයබාහු රජුය.[10] මාඝගේ ආක්‍රමණයන්හි ප්‍රබලතාව දරාගත නොහැකි වූ භික්ෂූන් වහන්සේලා ඒ වන විටත් රාජ්‍යයත්වයේ සංකේතය බවට පත්ව තිබූ දළඳා වහන්සේ හා පාත්‍රධාතුව රැගෙන මායා රටට පැමිණ සිටි අතර එහි ආරක්ෂාවේ

දුබලතා නිසා කොත්මලේ ප්‍රදේශයේ සඟවා තිබූ බව වංසකතා තුළ දැක්වේ.[11] තෙවන විජයබාහු රජු දඹදෙණිය අගනගරය කර ගැනීමෙන් අනතුරුව එසේ සඟවා තිබූ දළදාව හා පාත්‍රා ධාතුව බෙලිගල නම් ස්ථානයේ ගොඩනංවන ලද මාළිගයේ තැන්පත් කොට ශාසනික කටයුතු නැවත ස්ථාපිත කරවීමේ කටයුතු සඳහා මූලාරම්භය තබන ලදී.[12]

ශාසනයේ පැවැත්මට විනය පදනම් කර ගනිමින් පාලනය වන සංඝ සංස්ථාවක අවශ්‍යතාව වටහා ගෙන සිටි තෙවැනි විජයබාහු රජතුමා (1232-1236) සංඝ සංස්ථාවේ චිර පැවැත්ම උදෙසා ශාසන කතිකාවතක් සිදු කළ බව නිකාය සංග්‍රහයෙන්[13] හා දඹදෙණි කතිකාවතෙන්[14] හෙළි වේ. කතිකාවත් ඇතිකිරීමෙන් පමණක් නොනැවතුන විජයබාහු රජු දඹදෙණි නගරය ආසන්නයේම විජයසුන්දරාරාමය ඉදි කළේය. එපමණක්ම නොව භික්ෂුන් වහන්සේලාට දිනපතා සිව්පසයෙන් උපස්ථාන කරමින් උන්වහන්සේලාගේ අවවාද අනුශාසනා ලබා ගැනීමට කටයුතු කළේය.[15] නවක භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපනික තත්ත්වය දියුණු කිරීම සඳහා කටයුතු සම්පාදනය කළ තෙවැනි විජයබාහු රජතුමා තුන්රජයේ භික්ෂුන් වහන්සේලා කැඳවා අටපිරිකර සහිත දන් දෙමින් දින ගණනක් මුළුල්ලේ උපසම්පදා විනය කර්මය පවත්වා තිබේ.[16]

මෙම තොරතුරු හමුවේ පැහැදිලි වන්නේ ක්‍රි.ව. 13වන සියවසය ආරම්භයේදී අපගමනීය තත්ත්වයක් සනිටුහන් කරමින් තිබූ සංඝ සංස්ථාව සංවර්ධනීය තත්ත්වයක් කරා ගෙන ඒම උදෙසා තෙවන විජයබාහු රජු විශාල දායකත්වයක් ලබාදී ඇති බවය. මෙබඳු ආකාරයෙන් සංඝ සංස්ථාවේ පැවැත්ම උදෙසා තෙවෙනි විජයබාහු රජු කටයුතු කළත් එය එතරම් ප්‍රායෝගිකව ක්‍රියාවේ නොයෙදුන බව වංසකතා ගත තොරතුරු ඇසුරෙන් වටහා ගත හැකිය.[17] එහෙත් යම් අයුරකින් පොළොන්නරු යුගයේදී තිබුණාට වඩා යම් සංවර්ධනීය තත්ත්වයක් තුන්වන විජයබාහු යුගයේ ඇති වූ බවට සැක නැත. එහෙත් විනයෙන් පරිපූර්ණ සංඝ සංස්ථාවක් අපේක්ෂා කළ දෙවෙනි පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව.1236 - 1271) ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ගයන් අනුගමනය කරන ලද බව හඳුනාගත හැකිය. එකී කටයුතු සිදු කිරීම සඳහා එතුමා විසින් ත්‍රිපිටකය පිළිබඳ පුළුල් දැනුමක් තිබූ ස්වකීය

සහෝදර බුවනෙකබාහු කුමාරගේ ද සහයෝගය ලබාගෙන ඇත. ස්වකීය මුතුන්මිත්තන්ගේ ක්‍රියාකලාපයන් සංවර්ධනයට පත් කළ මෙතුමා භික්ෂු සංස්ථාවේ චිරස්ථායිතාව උදෙසා කතිකාවතක් සිදු කළේය.[18] කතිකාවත් කිරීමෙන් නොනැවතුණු මෙම රජතුමා සංඝ සංස්ථාවේ පැවැති විනය විරෝධී කටයුතු ඉවත් කිරීම සඳහා ශාසන ශෝධනයක් හා සංඝ සාමග්‍රියක් සිදු කොට තිබේ.[19] මෙකල භික්ෂූන් අතර සංවර්ධනයට පත්ව තිබූ මතවාදීමය අරගල දුරලා භික්ෂූන් සමගි කිරීම උදෙසා සොළී දේශයෙන් භික්ෂූන් ලංකාවට වැඩම කරවීමට ද මෙතුමා විසින් කටයුතු කරන ලද බව පූජාවලිය විසින් තහවුරු කොට සිටී[20]

මධ්‍යකාලීන යුගයේ සංඝ සමාජයේ ක්‍රියාකාරීත්වය ඉහළ දැමීමට අන්‍ය දේශයන්හි උගත් සිල්වත් භික්ෂූන් තම රටට වැඩමවාගැනීම පැරකුම් රජු කටයුතු කළ අතර එහි ප්‍රතිඵල ලෙසට මලය අර්ධද්වීපය හා හම්බරට්ට යන ප්‍රදේශවලින් භික්ෂූන් වහන්සේලා ලංකාවට වැඩම කොට ඇත.[21] භික්ෂූ සමාජයේ ප්‍රායෝගික වර්ධනය අපේක්ෂා කළ මෙතුමා ආධ්‍යාත්මික සංවර්ධනය සේම ශාසනයේ පැවැත්ම උදෙසා භෞතික වශයෙන් ද වෙහෙර විහාරාරාම ආදිය ඉදිකරවා ඇත. පළාබත්ගල විහාර නිර්මාණය මෙතුමාගේය.[22] ලක්දිව දක්නට නොමැති දුර්ලභ ගණයේ පොත්පත් විදේශයන්ගෙන් ගෙන්වා භික්ෂූන් අතර බෙදා හැරියේය. එසේම දෙවන පැරකුම් රජු ක්‍රි.ව. 1239, 1242, 1253, 1266 යන වර්ෂයන්හිදී උපසම්පදා පූජාවන් අටක් පැවැත් වූ බව වංසකතා සඳහන් කරයි.[23] අෂ්ට මූලයන් නියෝජනය කළ උභයවාසී තෙරවරුන් සඳහා ආරාමයන් ද මෙතුමා විසින් ඉදි කොටදී ඇත.[24] දෙවන පරාක්‍රමබාහු රජුගේ මෙකී සේවාවන් නිසා උගතුන්ගෙන් හා සිල්වතුන්ගෙන් මෙකල පෝෂිත වූ බව සංඝරක්ඛිත, සුමංගල, ධර්මකීර්ති, නාගසේන, ආනන්ද, වෛදේහ, බුද්ධප්‍රිය, අනෝමදර්ශි, ආදී භික්ෂූන් සේම ගුරපාද, ධර්ම කීර්තිපාද, ධීරනාගපාද රාජ මුරාරි, කවිරාජ මුරාරි, කවිරාසේකර, ගුරුළු දැමි, ආගම් චක්‍රවර්ති යනාදී ගිහිපැවිදි පඬිවරුන් පිළිබඳ සඳහන් වීමෙන් මැනවින් තහවුරු වේ.[25]

දෙවෙනි පරාක්‍රමබාහු රජුගෙන් පසුව දඹදෙණි සිහසුනට පත්වන්නේ බෝසත් විජයබාහු රජුය. (ක්‍රි.ව. 1271-1272) මොහුගේ

රාජ්‍ය සමය වර්ෂ දෙකක් පමණක් වුව ද උපරාජ සමයේ පියාණන් සමග එකතුව සසුනේ දියුණුවට කටයුතු කොට තිබේ.[26] මෙම රජුගෙන් පසුව දඹදෙණි රාජධානියට විරාමය තැබෙන අතර රාජ්‍ය කේන්ද්‍රය යාපහුව වෙත ගමන් කරයි. එසේ සිදුවන්නේ පළමුවැනි බුවනෙකබාහු රාජ්‍ය කාලය තුළ දීය (ක්‍රි.ව. 1272-1284). මෙම කාල පරාසය තුළ ශාසනික වශයෙන් විශේෂ සිදුවීමක් සිදු නොවේ. ක්‍රි.ව. 1284දි පමණ පාණ්ඩ්‍යයන් විසින් ශ්‍රී ලංකාවට ආක්‍රමණයක් එල්ල කොට දළදාව හා පාත්‍රාධාතුව සිය රටට රැගෙන යන ලදි. එහෙත් ක්‍රි.ව. 1287-1292 කාල පරාසය තුළදී තෙවැනි පරාක්‍රමබාහු රජු පාණ්ඩ්‍යයන් රැගෙන ගිය රාජ්‍යත්ව සංකේත වස්තූන් යළි ගෙන්වාගෙන පොළොන්නරුවේදී නායකත්වයට පත්ව තිබේ.[27] මෙම රාජ්‍යයත්වයට එරෙහිව යුධ ප්‍රකාශ කළ දෙවෙනි බුවනෙකබාහු (ක්‍රි.ව.1296-1302) දළදා වහන්සේ යළි යාපහුව වෙත වැඩම කරවා රාජ්‍යයත්වයට පත් වීය. මෙලෙසින් දෙවෙනි පරාක්‍රමබාහු රජුගෙන් පසුව සිදු වූ දේශපාලනමය අස්ථාවර තත්ත්වය මත ශාසනයේ ක්‍රියාකාරී කටයුතුවල අඩුවක් දැකගන්නට ලැබීම අරුමයක් නොවේ.

කෙසේ වෙතත් දෙවෙනි බුවනෙකබාහු රජුගේ රාජ්‍යතන්ත්‍රය ස්ථාවර තත්ත්වයක් කරා පැමිණෙන අතර සංඝයාගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු මෙකල වාර්තා වී තිබේ. පෙර රජවරු අනුගමනය කරමින් උපසම්පදා උත්සව පැවැත් වූ මෙතුමා බිඳී පැවති සංඝ සංස්ථාවේ ක්‍රියාකාරීත්වය පණගැන්වීම සඳහා භික්ෂූන් වහන්සේලාට පෙර සිරිත් පරිදි තනතුරු ආදිය ලබාදී තිබේ.[28] මෙබඳු සාමයික තත්ත්වයක් යටතේ කුරුණෑගල රජ කරමින් රාජ්‍යත්වයට පත්වන හතරවන පරාක්‍රමබාහු (1302-1327) සමයේ සංඝ සංස්ථාවේ ක්‍රියාකාරීත්වය තියුණු වූ අවධියක් ලෙස හඳුනාගත හැකි වේ. චෝල දේශ සීමාවට පැමිණි භාෂා නෛපුණ්‍යත්වයෙන් යුක්ත වූ තර්කාගමධර නම් භික්ෂුවක් ස්වකීය ගුරුවරයා ලෙස සලකා මෙතුමා කටයුතු කොට තිබේ.[29] භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපනික කටයුතු දියුණු කිරීම සඳහා මෙතුමන් විසින් පරාක්‍රම පිරිවෙන හා වීදාගම ශ්‍රී ඝනානන්ද යන පිරිවෙන් නිර්මාණය කොට ඇත.[30]

මෙලෙසින් ශාසනෝන්නතිකාමී වැඩසටහන් සිදුකරමින් පැමිණි සිව්වන පැරකුම් රජුගේ හදිසි අභාවය සමගින් කුරුණෑගල කේන්ද්‍රකොට ගනිමින් සමාජ සංස්කෘතික හා ආගමික කටයුතුවල නිරත වූ භික්ෂූන් වහන්සේලා ලංකාවේ විවිධ ප්‍රදේශවලට විසරණය වන ආකාරය හඳුනාගත හැකිය. කුරුණෑගල අතහැර පැමිණි නාගල වනරතන හිමියන් හාරිස්පත්තුවේ මැදවල ප්‍රදේශයට වැඩම කොට එහි ජරාවාස විහාරස්ථානයේ වැඩ සිට ඇත.[31] එසේම විල්ගම්මුල හිමියන් නිශ්ශංක අලගක්කෝණාරගේ සහය ඇතිව කිත්සිරිමෙවන් කැළණි වෙහෙර ප්‍රතිසංස්කරණය කොට වාසය කොට ඇත. මේ කරුණු තුළ පෙනෙන්නේ සිව්වන පැරකුම් රජුගේ අභාවය සමගින් සසුනේ ප්‍රබල යතිවරු රාජ කේන්ද්‍රය අතහැර අන් ප්‍රදේශයන් වෙත ගමන් කොට ඇති බවයි.

ඉනික්බිතිව එළඹෙන්නේ ගම්පළ රාජධානි සමයයි. ගම්පළ සමයේ ශාසනය තුළ පැවති තත්ත්වය පිළිබඳව නිකාය සංග්‍රය පැහැදිලි විස්තරයක් ඉදිරිපත් කරයි. මෙකල විසූ සිව්වන බුවනෙකබාහු (ක්‍රි.ව. 1341- 1351) රජු විසින් තමාගේ උපදෙස් පරිදි සේනාධිලංකාර ආමාත්‍යයා අමරගිරිවාසී වනරතන හිමියන්ගේ ප්‍රධානත්වයෙන් ක්‍රි.ව. 1351දී දුස්සීල පිරිස් සසුනෙන් නෙරපා ශාසනය පවිත්‍ර කොට ඇත.[32] සියම් රටේ වත්ජායි අභිලේඛනයේ[33] සිංහල මහාසාමි සංඝරාජයන් වහන්සේ නමක් ක්‍රි.ව. 1361 දී සුඛෝදයේ වත්ජායි විහාරයට වැඩම කළ බව දක්වන අතර උන්වහන්සේ අමරිගිරි වැසි වනරතන ස්වාමීන් වහන්සේ යැයි රෝහණධීර මහතා අනුමාන කරයි.[34] සෙනරත් පරණවිතාන මහතා ද මේ මතය දරන බව පෙනේ.[35]

මේ කරුණින් ප්‍රකට වන්නේ මෙකල විදේශයන් සමග වුව ද සබඳතා පැවැත්වීමට තරම් සංඝ සංස්ථාව සවිමත්ව සිටි බවයි. සිව්වන විජයබාහු රජුගෙන් පසු කාලයේ යළිත් රාජ්‍ය අස්ථාවර තත්ත්වයකට පත්වන බැවින් ක්‍රි.ව. 1351-1359 සමයේ ශාසන විලෝපනයක් ඇති වන බව හඳුනාගත හැකිය. මෙකල ඇති වන ශාසන විලෝපනයේ තත්ත්වය නැති කිරීම උදෙසා තෙවැනි වික්‍රමබාහු රජ දවස (ක්‍රි.ව. 1357-1374) විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කොට ඇත. නිකාය සංග්‍රය, සද්ධර්මරත්නාකරය, දඹුලු විහාර තුඩපත හා අස්ගිරි තල්පත අනුව සීලවංශ ධම්මකිත්ති හිමියන් නිශ්ශංක අලගක්කෝණාර

මන්ත්‍රීවරයාගේ ද අධාර ලබා ශාසන සංශෝධනයක් කළ බව දැක් වේ.[36] මෙසේ මෙකල ස්වකීය කැමැත්තට අනුව අනාචාරයේ හැසිරෙන භික්ෂූන්ගේ ක්‍රියාකලාප මර්දනය සඳහා රාජ්‍යයේ ඍජු මැදිහත් වීම යටතේ විවිධ ක්‍රියා මාර්ගයන් අනුගමනය කොට ඇති බව පෙනෙයි. අලගක්කෝණාර මන්ත්‍රීවරයා සහ ජයමහලේ සිටුවරයා ද එකතුව වික්‍රමබාහු රජුගේ දහහත්වැනි රාජ්‍ය වර්ෂය වන විට ශාසනික කටයුතුවල යෙදී සිටි බව අභිලේඛනමය සාධක හරහා ද තහවුරු වෙයි.[37]

වීර අලකේශ්වරගෙන් පසුව නිමාව සනිටුහන් කරන ගම්පොළ රාජධානියෙන් පසුව ගොඩනැගෙන කෝට්ටේ රාජධානි සමය භික්ෂු ක්‍රියාකාරීත්වයේ උපරිමයක් සනිටුහන් කරනු ලබන කාල පරාසයක් ලෙස හඳුනාගත හැකිය. ශාසනයේ දීප්තිය උදෙසා රාජ්‍යමය වශයෙන් ස්ථාවර තත්ත්වයක් ඇති කරන ලද හයවන පරාක්‍රමබාහු රජුගේ (ක්‍රි.ව. 1410-1468) කාර්ය පටිපාටිය මෙම යුගයේදී ප්‍රබල ලෙස බලපෑම් කරන ලද බව පෙනේ. මෙකී යුගයේ භික්ෂු ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵල ලෙස  ඔප්නැංවී පෙනුණු භික්ෂූන් ලෙස කෑරගල පද්මාවතී පිරිවෙනේ රාජගුරු වනරතන සංඝරාජ මාහිමි, තොටගමුවේ විජයබාහු පිරිවෙනේ තොටගමුවේ රාහුල තෙරුන්, පැපිලියානේ සුනේත්‍රාදේවී මහ පිරිවෙනේ මංගල හිමියන්, ඉරුගල්තිලක පිරිවෙනේ අධිපති හිමියන්, වීදාගම මෛත්‍රී හිමියන් ආදීන් හඳුනාගත හැකිය. ශාසනයේ ඉදිරි පැවැත්ම උදෙසා අගනා මෙහෙවරක් කළ මෙතුමා භික්ෂුවක විසින් අනුගමන කළ යුතු චර්යා පද්ධතිය දක්වමින් සුනේත්‍රා දේවී මහ පිරිවෙනෙහි කතිකාවතක් පිහිටුවා ඇත.[38] බුදු දහම පදනම් කොට ගනිමින් විදේශීය සබඳතා වර්ධිත යුගයක් ලෙසින්ද මේ යුගය හඳුනාගත හැකිය. ක්‍රි.ව. 1423-24 කාලයේ නබ්බිසි පුරයේ හා පහළ කාම්බෝජයේ භික්ෂූන් වහන්සේලා තිස් නමක් උපසම්පදාව ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ලංකාවට වැඩම කොට තිබේ.[39] එපමණක්ම නොවේ රාමඤ්ඤ දේශයේ මුත්තිම නගරයේ සුවණ්ණ සෝබන භික්ෂුව ලංකාවට පැමිණ වනරතන හිමියන් සමීපයේ උපසම්පදාව සහ අධ්‍යාපනය ද ලබා[40] යළි බුරුමයට වැඩම කොට එහි ධම්මචේතිය රජුගේ ද අනුග්‍රහය යටතේ කළ්‍යාණි සීමා නමින් නව භික්ෂු නිකායක් ද පිහිටවූ බවට තොරතුරු හමුවේ. තව ද ඉන්දියාවේ ගෞඩ

ප්‍රදේශයේ රාම චන්ද්‍ර නම් බ්‍රාහ්මණයෙකු ලක්දිවට පැමිණ රාහුල හිමියන්ගෙන් ත්‍රිපිටක ධර්මය ඉගෙන බුදු දහම වැළඳ ගෙන තිබේ.[41] වෙනත් යුගයන්ට සාපේක්ෂව මෙසේ බුදු දහම පදනම් කර ගනිමින් ජාත්‍යන්තරව සබඳතා මේ යුගයේ වර්ධනය වීමට හේතුව නම් පැහැදිලිව භික්ෂුවගේ ක්‍රියාකාරකම්හි සංවර්ධනීය තත්ත්වයයි. මෙකී තොරතුරු හමුවේ කෝට්ටේ රාජ්‍ය සමයේ මුල් යුගයේ භික්ෂුවගේ භූමිකාව ප්‍රබල සන්දර්භයක් යටතේ ගොඩනැඟී තිබූ බව වටහා ගත හැකිය.

කෝට්ටේ රාජ්‍ය තුළ හයවන පරාක්‍රමබාහු රජුගේ ඇවෑමත් සමගින් ඇති වූ දේශපාලන වියවුල්කාරී තත්ත්වය විසින් සසුනේ පැවැත්ම පිළිබඳව ද තීරණ ගනු ලබන ආකාරය දක්නට ලැබේ. රාජ්‍යයේ අභ්‍යන්තර අරගලවලට අමතරව 1505 දී සිදුවන පෘතුගීසි ආගමනය සමගින් සංඝ සංස්ථාව අඳුරේ සැඟවෙනු දැක ගත හැකිය. පොළොන්නරු යුගයෙන් ඇරඹි කෝට්ටේ යුගයෙන් නිමාව සනිටුහන් කරනු ලබන සියවස් පහක කාල පරාසය තුළ රජය සහ භික්ෂුව අතර පැවති අන්‍යෝන්‍ය බද්ධතාවයේ ස්වරූපය පිළිබඳ නිශ්චිත අවබෝධයක් පූර්ව තොරතුරු විග්‍රහය හමුවේ ලබා ගත හැකිය වනු ඇත.

## බටහිර ආක්‍රමණ, භික්ෂුව හා සමාජය

ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේදී පමණ ලංකාවේ ආරම්භය සනිටුහන් කරන භික්ෂු සංස්ථාවට ස්වකීය දර්ශනය ආගමක් ලෙස ප්‍රචාරය කිරීමේ දී අභියෝගයන්ට මුහුණ දෙන්නට සිදුවූයේ ඉතා අල්ප වශයෙනි. අනුරාධපුර යුගයේ දී රාජ්‍යයට ආක්‍රමණ එල්ල වුවත් ආගමට සැලකිය යුතු ආකාරයේ බලපෑමක් සිදුවූයේ නැත. පොළොන්නරු යුගයේ දී කාලිංග මාඝ ආක්‍රමණයන්ගෙන් බෞද්ධාගමට හානිදායක තත්ත්වයක් ඇතිවූවත් එම තත්ත්වයන් ඉක්මනින් ගොඩනැංවිය හැකි විය. දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ හා කෝට්ටේ රාජ්‍යයේ මුල් කාලවකවානුවේ ද සංවර්ධිත බුදුදහමට හානිදායක වාතාවරණයක් ඇතිවූයේ ඉතා අල්ප වශයෙනි. මෙකී සමයන්හිදී බුදුදහම ලංකාවේ ප්‍රමුඛ ආගම බවට විවාදයක් හෝ ඇදහීමට බාධාවක් හෝ නොවීය. භික්ෂුව හා රජු, පන්සල හා සමාජය

අතර පැවතියේ අවියෝජනීය සබඳතාවයකි. සියවස් දහ අටක් පමණ මෙම තත්ත්වය උච්චාවචනය වෙමින් අඛණ්ඩව පැමිණි ආකාරය පූර්ව සකච්ඡා තුළින් මැනවින් පැහැදිලි කොට ඇත. මෙම සියවස් දහ අට තුළම හඳුනාගත හැකි සුවිශේෂ ලක්ෂණය වන්නේ භික්ෂුව ලාංකේය සමාජ දේහයේ ප්‍රබල භූමිකාවක් නියෝජනය කරමින් සමාජය ගමන් කළ යුතු දිශාව තීරණය කරන්නෙකු ලෙස කටයුතු කරනු ලැබ සිටීමයි.

කෙසේ නමුත් මෙම තත්ත්වයන් පරිකෘතිකමය වශයෙන් වෙනසකට පහළොස්වන සියවසෙන් පසුව බිඳුන්වන ආකාරය හඳුනාගත හැකිය. 1412 දී පමණ ආරම්භය සනිටුහන් කරන කෝට්ටේ රාජධානිය 1521 දී සිදුවන විජයබා කොල්ලය නමැති ඓතිහාසික සිදුවීමත් සමග කොටස් වලට බෙදීයාම ආරම්භ වේ.[42] හයවන විජයබාහු රජුගේ (1513-1521) ඝාතනයෙන් පසු කෝට්ටේ පාලනය එතුමාගේ වැඩිමල් පුතු වන හත්වන බුවනෙකබාහු කුමරු (1521-1551) යටතේ ද රයිගම ප්‍රදේශය පරරාජසිංහ කුමරු යටතේ ත් සීතාවක ප්‍රදේශය මායාදුන්නේ කුමරු (1521-1581) යටතේ ත් පාලනය කිරීම සිදුවේ. රයිගම පාලනය කරමින් සිටි පරරාජසිංහ කුමරා ටික දිනකින් මියගිය නිසා එම ප්‍රදේශයේ ද පාලන අයිතිය මායාදුන්නේ කුමරා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මේවන විට ශ්‍රී ලංකාවේ කෝට්ටේ හා සීතාවක වශයෙන් ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථාන දෙකක් වූ අතර කන්ද උඩරට ප්‍රදේශය වික්‍රමබාහු නම් ප්‍රාදේශීය පාලකයෙකු යටතේ පාලනය විය. මේ අතර තුර රාජ්‍යත්වය ලබාගැනීමේ අපේක්ෂාවෙන් පසුවූ මායාදුන්නේ කුමාරයාගේ ආක්‍රමණකාරී තර්ජන නිසා ක්‍රි.ව. 1505 වන විට ලංකාවට පැමිණ සිටි පෘතුගීසීන්ගේ සහය ලබාගනිමින් තම බල ප්‍රදේශය රැකගැනීමට හත්වන බුනෙකබාහු රජුට සිදුවිය. අතකින් කඩුවක් ද අතකින් බයිබලය ද රැගෙන පැමිණි පාතුගීසීන්ට ලංකාවේ පැවති දේශපාලනමය වාතාවරණය ස්වකීය වාණිජ පරමාර්ථ සේම ආගමික පරමාර්ථ සඵලකරගැනීම සඳහා මැනවින් ගැලපුණි.

මෙම කාල වකවානුව අධ්‍යයනය කරන විට මුහුණ දීමට සිදු වන ප්‍රධාන ගැටලුවක් වන්නේ දේශීය මූලාශ්‍රයන්හි පවතින ඌණතාවයයි. මහාවංසයේ සහ රාජාවලියේ සඳහන් පෘතුගීසි ආගමනය පිළිබඳ ස්වල්ප වූ තොරතුරක් හැරෙන්නට අන් දේශීය මූලාශ්‍රයක් මෙම කාලවකවානුවේ තොරතුරු වාර්තා නොකරයි. එමනිසා තොරතුරු

සොයාගැන්මට සිදුව ඇත්තේ පෘතුගීසි වාර්තාකරුවන්ගේ වාර්තා තුළිනි. එවිට නිතැතින්ම එම තොරතුරු පක්ෂග්‍රාහී වේ. එනිසා මෙකී කාලවකවානුවේ භික්ෂුවගේ කාර්ය ප්‍රමාණය පිළිබඳව විමසීමේ දී බොහෝ ප්‍රවේශම් විය යුතුය.

පස්වන නිකලස් පාප්තුමාගේ ප්‍රකාශ සහ එවකට පෘතුගීසි අධිරාජ්‍යයා වූ මැනුවෙල්ගේ ලිස්බන් ප්‍රකාශයේ තොරතුරු විමසන විට පැහැදිලි වන්නේ ක්‍රිස්තියානි ආගම පැතිරවීම පෘතුගීසීන්ගේ ආගමනයේ ප්‍රමුඛතම අභිලාසයක් වූ බවයි.[43] එවිට නිතැතින්ම ඔවුනගේ ප්‍රහාරයට ලංකාවේ ප්‍රධානතම ආගම වූ බුද්ධාගම සහ භික්ෂූන් වහන්සේ ලක්වේ. ඒ සඳහා උදාහරණ බොහොමයක් පෘතුගීසි ලේඛන තුළම අන්තර්ගතව තිබේ. ලේඛක ක්වේරෝස් දක්වන්නේ බෞද්ධ අගමික කටයුතු හා බණ දේශනා කිරීම් තහනම් කොට එයට අවනත නොවූ අයට හිංසා කරන ලද බවයි.[44] බෞද්ධ භික්ෂූන් පිළිබඳව දක්වමින් සඳහන්කොට ඇත්තේ ඔවුන්ගේ අන්තිමයා ද හිස ගසා දමන ලද බවයි. එපමණක්ම නොවේ පෘතුගීසීන්ට විරුද්ධව කැරැල්ලක් ඇතිකිරීමේ චෝදනාවට වැරදිකරුවන් වූ භික්ෂූන් වහන්සේලා තිස් නමක් පමණ එල්ලා මරාදමන ලද බව ද දක්වා තිබේ.[45] මීට අමතරව පෘතුගීසි වාර්තාවක දැක්වෙන්නේ පනවන ලද තහනම නොතකා ධර්ම දේශනා පැවැත්වීම සඳහා අලුත්කුරු කෝරලයට පැමිණෙන භික්ෂූන් වහන්සේලා තිදෙනෙකු කපිතාන් ජෙනරාල් විසින් මිනීමස් කන කිඹුලන් සිටි රොසානි ගඟට විසිකළ බවයි.[46] මෙම තොරතුරු තුළින් පැහැදිලිවම පෙනෙන්නේ පෘතුගීසීන් විසින් භික්ෂූන් වහන්සේලා දැඩි මර්දනයකට ලක්කොට ඇති බවය. භික්ෂුව සමාජයෙන් අතුගාදැමීමට කටයුතු කොට ඇති බවයි.

කෝට්ටේ නාම මාත්‍රික පාලකයාව සිටි ධර්මපාල කුමරු ක්‍රිස්තියානිය වැළඳගත්තෙකු වූ නිසා මෙන්ම ඉවසිය නොහැකි පෘතුගීසි බලපෑම් හමුවේ රාජපාක්ෂික භාවයෙන් මිදුණු බොහෝ කෝට්ටේ වැසියෝ සීතාවක මායාදුන්නේ වටා එකතු වූහ. මේ සඳහා හේතු වූ තවත් කාරණාවක් වූයේ ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වයේ සංකේතය[47] ලෙස සැලකූ දන්ත ධාතුව හිරිපිටියේ රාළ විසින් සීතාවකට රැගෙන විත් මායාදුන්නේ වෙත බාර දී තිබීමයි.[48] මෙම හේතු කාරණාවන් නිසා කෝට්ටේ සහ කන්ද උඩරට ස්වාධීන රාජධානි

දෙකක් පවතිද්දී සීතාවක ශ්‍රී ලංකාවේ අගනුවර බවට පත්විය. භික්ෂූන් වහන්සේලා ද මේ සියලු හේතු කාරණාවන් පදනම් කොට ගනිමින් සීතාවක රාජ්‍යය වටා එකතු වූ ආකාරය හඳුනාගත හැකිය.

සීතාවක රාජ්‍යයේ පැවති සුවිශේෂී බෞද්ධ සිද්ධස්ථාන ලෙස ශ්‍රී පාදස්ථානය, දෙල්ගමු රජමහ විහාරය, නැදුන් විහාරය, බිම්ගොඩ රජමහ විහාරය, කරදන ගල් විහාරය ආදිය හඳුනාගත හැකිය. [50] මෙම විහාරයන්ගෙන් දෙල්ගමුව දළදා මාළිගය පිහිටීමෙන් ද කරදන ගල්විහාරය භික්ෂූන් වහන්සේලා මැදුම් සඟිය ලිවීම සිදුකළ ස්ථානය හැටියට ද බිම්ගොඩ රජමහ විහාරය සීතාවක යුගයේ මහා පඬිවරයා අලගියවන්න මුකවෙටි කවියාගේ පුස්තකාලය පිහිටි ස්ථානය වීමෙන් ද විශේෂ ස්ථානයක් ගනී. මෙම විහාරස්ථානවලට හෝ විහාරස්ථානවල වාසය කළ භික්ෂූන් වහන්සේලාට විශේෂ සැලකිලි දැක් වූ බවට තොරතුරක් හෝ භික්ෂූන් වහන්සේලා රජු සමග විශේෂ සබඳතාවක් පැවැත් වූ බවට තොරතුරක් මෙකල ඉතිහාසය වාර්තාකරන රාජාවලිය, අස්ගිරි තල්පත, සුලු රාජාවලිය, මහාවංසය ආදී කිසිදු කෘතියක සඳහන් නොවේ. එසේ වන්නට ඇත්තේ විශාල යුධ ක්‍රියාවලියකට සීතාවක පාලකයින් දෙදෙනා වූ මායාදුන්නේ හා රාජසිංහ මැදිවී සිටීමත් විශේෂ බෞද්ධ අභාසයක් මෙම පාලකයන් දෙදෙනාටම නොලැබීමත් හේතුවෙනි. කෙසේ නමුත් රාජ්‍යය සහ භික්ෂුව අතර සබඳතාවය යම් ආකාරයකට තහවුරු වන සිදු වීම් කිහිපයක් මෙකී යුගය තුළින් හඳුනාගත හැකිය.

ක්‍රි.ව. 1580-1592 කාල වකවානුවේ සීතාවක පාලනය කළ[51] පළමු රාජසිංහ රජු තම රාජ්‍ය කාලය වූ දොළොස් වසරේම වසරක් පාසා දෙල්ගමු විහාරයේ මහින්දාලංකාර හිමියන් බාරයේ පැවති දළදාව වෙනුවෙන් පෙරහර පවත්වමින් ඉඩම් පූජාකිරීම් සිදුකොට තිබේ.[52] සැවුල් සන්දේශය සහ සීතාවක හටන කෘති තුළින් ද රාජසිංහ රජුගේ ආගමික ලැදියාව පිළිබඳ යම් ආකාරයක තහවුරුවක් ලබාගත හැකිය.[53] එසේම රාජසිංහ රජු මිය යන අවස්ථාවේ තෙරුවන් ගුණ සිහිපත් කොට භික්ෂූන් වහන්සේලා ගෙන්වා පිරිකර පූජාකිරීම පවා සිදුකොට තිබේ.[54] මෙලෙස බුද්ධාගම හා සබැඳිව කටයුතු සිදුකොට තිබුණේ වුව ද පෙනීයන්නේ භික්ෂුව සහ රජු අතර ප්‍රබල බද්ධතාවක් නොතිබි බවයි.

කෙසේ නමුත් මහාවංසය සහ මන්දාරම් පුවත දක්වන අකාරයට සීතාවක රාජසිංහ රජු තම රාජ්‍ය කාලයේ අවසන් භාගයේ ශිව ආගම වැලඳ ගනිමින් බුදු දහමට විශාල විනාශයක් සිදුකොට තිබේ. මේ පිළිබඳව පුළුල් අධ්‍යයනයක් සිදුකොට ඇති රිසිමන් අමරසිංහ''සීතාවක රාජධානියේ උන්නතියේ ද අවනතියේ ද සමහර අංශ පිළිබඳ විමර්ශනයක් '' කෘතියෙන් පෙන්වා දෙන්නේ රාජසිංහ රජු රජද්‍රෝහී භික්ෂූන් විනාශයට පත් කළ නමුත් බුදු දහමට හානියක් නොකළ බවයි. සීතාවක රාජසිංහ රාජ්‍ය කාලය පුස්කොළ ලිපිය සහ මානියම්ගම පුස්කොළ ලිපිය ඇසුරින් රිසිමන් අමරසිංහයන් පෙන්වාදෙන්නේ දෙවනගල රතනාලංකාර හිමියන් සහ ගම්පොළ රාජගුරු ධර්මකීර්ති අනුනායක හිමියන් රාජසිංහ රජුට විරුද්ධව කුමන්ත්‍රණය කොට කොනප්පු බණ්ඩාර[57] මහනුවර රජ කරවීමට කටයුතු කළ බවයි. මෙම කථාව අස්ගිරි තල්පත විසින් ද තහවුරු කරනුලැබ තිබේ.[58] රාජසිංහයන්ගේ භික්ෂු විරෝධය පිළිබඳව ඉතා සූක්ෂමව අධ්‍යයනය කරන විට පෙනෙන්නේ ඔහු භික්ෂු විරෝධය අරඹන්නේ කන්ද උඩරට බලය අහිමි වූ පසුව බවයි. එයින් පෙනෙන්නේ කන්ද උඩරට බල පෙරලිය සඳහා භික්ෂූන් වහන්සේ ප්‍රමුඛ මෙහෙවරක් සිදුකොට ඇතිබවයි. පෘතුගීසි ආගමනයත් සමගින් බිඳී විසිරී යන රාජ්‍ය හා භික්ෂුව අතර තිබූ සම්බන්ධතාවය මහනුවර රාජධානියේ ආරම්භයත් සමගින් යළි සක්‍රීය වන ආකාරයක් මෙම තොරතුරු තුළින් මනාව වටහාගත හැකිය.

මහනුවර යුගයේ දී සීතාවක සමයේ දෙදරාගිය භික්ෂුව සහ රාජ්‍ය අතර සබඳතාවය වර්ධනය වනවා පමණක් නොව අන් යුගයන්ට සාපේක්ෂව නව හැඩයක් ගන්නා බවද හඳුනාගත හැකිය. එයට හේතුව වී ඇත්තේ මෙකල රජවරු භික්ෂූන්ට විශේෂ වරප්‍රසාද ලබා දෙමින් ඔවුන්ගේ සිත් දිනාගෙන ඒ හරහා ජනතාව දිනාගැනීමට ප්‍රයත්න දැරීමයි. තමන්ට සහය දක්වන භික්ෂූන්ට ප්‍රත්‍යුපකාර කිරීම සෑම යුගයකම සිදු වී තිබුනත් මෙම යුගයේ එහි විශේෂතාවක් වන්නේ රටේ පැවති අස්ථාවර තත්ත්වයන් සමගින් ලද වරප්‍රසාද නිසා භික්ෂුව ඉක්මනින් ප්‍රතිපත්ති අතින් පිරිහීමය. නායක්කර් වංශික රජවරු රාජ්‍යත්වයට පත්වීම මෙම තත්ත්වය තවත් තීව්‍ර කිරීමක් විය. ස්වකීය පැවැත්මේ ස්ථාවරත්වය වෙනුවෙන් රජවරු ආගම භාවිත කිරීම පූර්ව

කරුණු දැක්වීම් තුළ සාමාන්‍ය දෙයක් වුව ද මෙම සමයේ පාලනයකින් තොරව එය සිදුවීම නිසා සහ ප්‍රබල මධ්‍යගත නායකත්වයක් භික්ෂු සංස්ථාව තුළ සංඝරාජ සමයට පෙර හෝ පසු නොතිබීම රාජ්‍යයේ පැවැත්මට සේම ආගමේ පැවැත්මට ද බොහෝ සේ බලපා ඇති බව වටහා ගත හැකිය. එසේ වූයේ වූ නමුත් රාජ්‍ය පැවැත්මට බලපෑම් කිරීමේදී සහ ඉදිරියට පවත්වාගෙන යාමේදී රජු සහ භික්ෂුව අතර ප්‍රබල සබඳතා පැවති බව හඳුනාගත හැකිය.

සීතාවක රාජසිංහ රජු විසින් සිදු කළ භික්ෂු සංහාරයට බියෙන් රටේ විවිධ ස්ථානයන්හි සැඟවී දිවි බේරාගත් භික්ෂූන් වහන්සේලා යළිත් ප්‍රසිද්ධ ස්ථානවලට කැඳවා වාසය කරවීමට විමලධර්මසූරිය රජු සහ සෙනරත් රජු කටයුතු සලස්වා ඇත. හතරකෝරළයේ දෙවනගල වැඩවිසූ ඉරුගල් සාමි සහ සූරිය සාමි යන හිමිවරු ඌවේ කෝට්ටේගොඩ ගල්ගෙයක සිටියදී උලුගල විහාරස්ථානයට කැඳවා වාසය කරවා තිබේ.[59] එසේම කොත්මලේ සැඟවී සිටි දොළොස්නමක් අලුලෙන, කරඬුලෙන හා කිඳගොඩ ආරාමය හා බෝධිමාලක විහාරය යන ස්ථානවල වාසය කරවා තිබේ. එපමණක්ම නොවේ මහනුවර කිරීටය අත්පත් කරගැනීම සඳහා විමලධර්මසූරිය රජුට සහයෝගය ලබාදුන් දෙවනගල රතනාලංකාර හිමියන්ට කෙත්වතු පූජාකොට තිබේ.[60] සියවසකට ආසන්න කාලයක් රටේ පැහැදිලි ස්ථාවර භාවයක් නොතිබි නිසා පරිහානියට පත්ව තිබූ බුදුදහම පෝෂණය කිරීම සඳහා විමලධර්මසූරිය රජු විසින් රක්ඛංග දේශයට දූතයන් යවා භික්ෂූන් වහන්සේලා ගෙන්නවා 1596 දී පමණ උපසම්පදා විනය කර්මයක් පවත්වා ශාසනික චිරස්ථිතියට වැඩ කටයුතු සිදුකොට තිබේ.[61] එහෙත් සරණංකර සංඝරාජ සමය ලියූ කොටගම වාචිස්සර හිමියන් පෙන්වාදෙන්නේ මෙය ශාසනයේ දියුණුවට නොව තව දුරටත් අවනතියට හේතු වූ බවයි. නමුත් විමලධර්මසූරිය රජුගේ අපේක්ෂාව සසුන නගා සිටුවීම බව සැක නැත.

ශ්‍රී ලංකා ඉතිහාස රාජ නාමාවලියෙහි උපැවිදිව රජකමට පත් රජවරු සිව්දෙනෙකි. අනුරාධපුර යුගයේ රජ කළ මකලන්තිස්ස රජු ඉන් පළමුවැන්නාය. දෙවැන්න එම යුගයේම රජ කළ මහානාම රජුය. තෙවැන්න ධාතුසේන රජු වන අතර සිවුවැන්නා වන්නේ මහනුවර රාජ්‍යයේ දෙවන රජු ලෙස අභිෂේක ලබන සෙනරත් රජුය.[63] මෙකල

භික්ෂුව සහ රජු අතර සබඳතාවයට මෙය කදිම නිදසුනකි. සෙනරත් රජුගෙන් පසුව රජකමට පත්වන දෙවන රාජසිංහ රජු ද යුධමය ක්‍රියාවලීන්ට මැදිව කල්ගතකළ හෙයින් ශාසනය කෙරෙහි අවධානය දැක්වූයේ මඳ වශයෙනි. එම හේතුව සහ තවත් විවිධ හේතු නිසා පරිහානියට පත්වෙමින් පැවති ශාසනික ස්වරූපය කන්ද උඩරට රජුගේ සිරකරුවෙකු ලෙස සිටි රොබට් නොක්ස්ගේ එදා හෙළදිව කෘතියෙන් මනාව දතහැකිය.[64] එකී පරිහානියේ පසුකාලීන වර්ධිත තත්ත්වයන් අයිත්තාලියද්දේ මුහන්දිරම් රාළගේ සංඝරාජ සාධු චරියාව[65] සහ මුංකොටුව රාළගේ සඟරජ වත[66] යන කෘති තුළ පැහැදිලිව සටහන්ව තිබේ. ඓතිහාසිකමය වශයෙන් භික්ෂුව ගොඩනගාගෙන තිබූ පෞර්ෂත්වය නිසාම ඔහු ප්‍රතිපත්තිමය වශයෙන් පරිහානියට පත්වුව ද සමාජමය බලයේ අඩුවක් නොවූ බව දෙවන රාජසිංහරජුගේ විශේෂ දූතයෙකු ලෙස අර්ධ භික්ෂුවක ලෙස සැලකිය හැකි පෝයමලුවිහරයේ මහානායක ගණේ බණ්ඩාර 1687 දී ලන්දේසීන් වෙත යාමෙනුත් තවත් ගණින්නාන්සේ කෙනෙකු වූ කොබ්බෑකඩුවේ ගණේ බණ්ඩාර 1732 දී පමණ පුත්තලමේ හා පානමේ දිසාපති ලෙස වැඩකටයුතු සිදුකොට තිබීමෙනුත් පැහැදිලි කරගත හැකිය.[67] ශාසන ඉතිහාසයේ මෙබඳු නිලතල දැරීම් අතිශය විරල වුවත් මෙමගින් ගම්‍යමාන වන්නේ රාජ්‍යයේ කටයුතු වලට භික්ෂුවගේ මැදිහත් වීමේ ප්‍රමාණය සහ ස්වරූපයයි.

ලන්දේසි උපකාර මත දෙවන විමලධර්මසූරිය රජුගේ ප්‍රමුඛත්වයෙන් අරකන් රටෙන් භික්ෂූන් ගෙන්වා මෙහි උපසම්පදාව යළිත් පිහිටුවා තිබේ.[68] තුන් මහල් දළදා මැදුරක් නිර්මාණය කරවූ මෙතුමා භික්ෂූන් වහන්සේලාගේ උපදෙස් පරිදි දළදා තේවා පැවැත්වීම් ආදී ආගමික කටයුතු සිදු කළේය.[69] මෙතුමාගෙන් පසුව රජකමට පත්වන්නේ අවසාන සිංහල රජු ලෙස සලකන වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුය. මොහුගේ ගුරුවරයා ලෙසින් කටයුතු කොට ඇත්තේ සූරියගොඩ රාජසුන්දර ගණින්නාන්සේය.[70] මෙම කටයුතු කිරීම නාම මාත්‍රික පැවතීමක් බව පෙනෙන්නේ නරේන්ද්‍රසිංහ රජුගේ ක්‍රියාකලාපයන් දෙස බැලීමෙනි. දෙවන විමලධර්මසූරිය රජ දවස උඩරට ව්‍යාප්ත වීම ඇරඹූ ක්‍රිස්තියානි දහම නරේන්ද්‍රසිංහ රජුගේ සමයේදි ප්‍රබල තත්ත්වයකට පත්වූයේය. ජෝසප් වාස්, ජෙකම්

ගොන්සාල්වේස් යන ප්‍රධාන පූජක වරුන් සේම පේදුරු ගස්කොන්, ලැනරෝල් ආදී විදේශිකයන් නිතර ඇසුරු කළේය.[71] මෙයින් නරේන්ද්‍රසිංහයන් තුළ බුදු දහම කෙරෙහි හෝ භික්ෂුව පිළිබඳව විශේෂ අවධානයක් නොවීය. රජු තම මහාධිකාරම් බවට පත්කරගෙන සිටි ගස්කොන්ගේ හිස ගසාදැමීම පදනම් කොටගත් කරුණක් පදනම් කරගනිමින් සූරියගොඩ රාජ සුන්දර ගණින්නාන්සේට මරණ දඬුවම ලබා දේ.[72] රජුගේ ගුරුවරයා යැයි සඳහන් මෙම සමයේම ශාසනික විප්ලවයක් සිදුකරණ වැලිවිට සරණංකර හිමියන්ගේ ගුරුවරයා වූ මෙම සූරියගොඩ ගණින්නාන්සේ මරණයට පත්කිරීම පිළිබඳව කිසිදු විරෝධයක් මතු වූ බවට සාධක හමු නොවීමෙන් පෙනීයන්නේ භික්ෂුව පිළිබඳ වටිනාකම හීනව පැවති බවයි. එසේම රජු සහ භික්ෂුව අතර බද්ධතාවය දුරස්ථ වූ බවයි.

එසේ වූයේ වූ නමුත් මෙම කාල වකවානුවේදීම නිවැරදි භික්ෂු ප්‍රතිපත්ති සහ පිරිහීතිබූ අධ්‍යාපන තත්ත්වය ගොඩනැංවීම මගින් රාජ්‍ය අවධානය මෙන්ම රට කරවීමට භික්ෂුව විසින් සිදුකළ ඓතිහාසික බලපෑම නැවත සමාජගත කිරීමට වැලිවිට සරණංකර හිමියන් සමත්ව තිබේ. තත්කාලීනව පිරිහීමට ලක්ව ගණින්නාන්සේලාගේ අධිපත්‍යයට නතුව තිබූ සංඝ සංස්ථාව නැවත ගෞරවනීය තත්ත්වයට ඔසවා තැබීමට සරණංකර හිමියන් දරන ලද අනූපම වෙහෙස පිළිබඳව තොරතුරු සංඝරාජ සාධු චරියාව විසින් මැනවින් පෙන්වා දෙයි. ඉන්දියාවෙන් පැමිණි සංස්කෘත උගත් බමුණෙකු ඉදිරිපත් කළ සංස්කෘත ශ්ලෝකයක අර්ථ පැහැදිලි කිරීමට කිසිවෙකු නොවූයෙන් එයට ඉදිරිපත්ව ශ්ලෝකයේ තේරුම පමණක් නොව බමුණාට බුදුදහම ගැන ද කියා දී තිබේ.[73] මෙම සිදුවීමෙන් පසුව සරණංකර හිමියන් පිළිබඳව ප්‍රසාදයට පත් නරේන්ද්‍රසිංහ රජු එම හිමියන් ආරම්භකොට තිබූ සිල්වත් සමාගමට සහ අධ්‍යයන කටයුතු වලට රාජ්‍ය අනුග්‍රහය ලබාදුන්නේය. කෝට්ටේ යුග පරිහානියෙන් පසුව රාජ්‍ය අනුග්‍රහයෙන් නියම කන්දේ පිරිවෙනක් මෙකල ඉදිවේ.[74] ප්‍රතිපත්තියෙන් සහ දැනුමින් පොහොසත් සරණංකර හිමියන් ඇතුළු භික්ෂූන් ක්‍රමිකව ස්වකීය බලය රාජ්‍ය තන්ත්‍රය වෙත මුදාහරින ආකාරය නරේන්ද්‍රසිංහ රජුගෙන් පසුව බලයට පත්වන නායක්කර්වංශික විජය රාජසිංහ රජු දවස මැනවින් හඳුනාගත හැකිය. රජකමට පත්වීමට පෙර

සිටම විජය රාජසිංහ කුමරු සරණංකර හිමියන් යටතේ අධ්‍යාපනය ලද අතර ලංකාවේ රජකම නායක්කර් වංශිකයෙකු පත්වනවාට විරුද්ධ වූ ඇමතිවරු එයට කැමති කරවාගැනීමට සරණංකර හිමියන් සමත් විය. ඒ අනුව විජය රාජසිංහ සරණංකර හිමියන් අතින්ම ඔටුණු පළඳා රාජ්‍යත්වයට ඔසවා තැබීය.[75]

මේ තුළින් මැනවින් චිත්‍රණය කරනු ලැබ ඇත්තේ වියැකෙමින් තිබූ භික්ෂුව සහ රාජ්‍ය අතර වූ සබැඳියාව යළිත් ස්ථාපිත වූ බවයි. විජය රාජසිංහ රජු (1739-1747) විසින් රජ ගුරු තනතුරින් ද සරණංකර හිමියෝ සම්භාවනාවට පත් කරන ලදහ. විජය රාජසිංහ රජුගෙන් පසුව රජපත්වන කීර්ති ශ්‍රී රාජසිංහ රජු (1747-1782) ද භික්ෂු අනුශාසනා යටතේ කටයුතු කළ අතර ලංකාවෙන් වියැකී ගෙස් තිබූ උපසම්පදාව යළි මෙහි ස්ථාපිත කරවීම සඳහා පූර්ණ අනුග්‍රහය දැක්වීය.[76] රාජ්‍ය පරිපාලනමය වශයෙන් මෙකල (1760) සිදුවන විශේෂ සිදුවීමක් නම් කීර්ති ශ්‍රී රාජසිංහ රජු ඝාතනය කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීමයි. මෙම අසාර්ථක කුමන්ත්‍රණයට මල්වතු විහාරීය භික්ෂූන් පිරිසක් සේම සරණංකර හිමියන් ද හවුල් කරුවන් වූ බවත් සරණංකර හිමියන්ගේ වරද, කුමන්ත්‍රණය දැනගෙනත් රජුට නොදැන්වීම බවත් දැක්වේ. කෙසේ වෙතත් මෙහිදී අවධානයට ලක්කළ යුත්තේ බුදුදහමට අනුග්‍රහය දැක්වූ රජෙකුට එරෙහිව භික්ෂූන් නැගී සිටියේ කුමන හේතු පදනම් කොටගෙන ද යන්න පිළිබඳවයි. එහිදී පැහැදිලි වන්නේ රජු බුදුදහමට අනුග්‍රහ දැක්වූවත් ස්වකීය හින්දු ඇදහීම් අත්නොහළ නිසාත් රජුගේ ජන්මය විදේශික නිසාත් සමරක්කොඩි අධිකාරම්ගේ හා මොළදණ්ඩේ ගජනායක නිලමේගේ ද සම්බන්ධයෙන් මෙකී කුමන්ත්‍රණය ක්‍රියාත්මක කොට ඇති බවයි. මෙහිදී ස්වකීය ජාතිය පිළිබඳ චින්තනය පැහැදිලිව මතුව තිබෙන බව පෙනේ. එසේම මෙහි දී මතුවන අනෙක් කාරණාව නම් භික්ෂුව සමාජමය වශයෙන් බලවත් වීමෙන් ඍජුවම පාලන තන්ත්‍රය වෙනස් කිරීමට දායක වී තිබීමයි.

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් පසුව රජකමට පත්වන රාජාධි රාජසිංහ රජුගේ (1782-1798) ගුරුවරයා ලෙස කටයුතු කරන්නේ මොරතොට ධම්මක්ඛන්ධ හිමියන්ය.[77] අසදෘශ ජාතක කාව්‍යය රචනා කරන රාජාධි රාජසිංහ රජු ස්වකීය ගුරුවරයා ඉමහත් බැතියෙන් වර්ණනා කරයි.[78] මේ තුළින් පෙනෙන්නේ ධම්මක්ඛන්ධ

භික්ෂුව රජුට ප්‍රබල බලපෑම් කොට ඇති බවයි. රාජාධි රාජසිංහ රජු මරණාසන්නව සිටින අවස්ථාවේ මීළඟ අනුප්‍රාප්තිකයා කවරෙක්දැයි රජයේ ප්‍රධානියෙකු සමග මොරතොට හිමියන් සාකච්ඡා පවත්වා ඇත. එහිදී මෙම හිමියන් ඔහුට දී ඇති උපදෙස වන්නේ ''ඔබ අදහස්කරන තැනැත්තා වැනි කෙනෙක් මුලදී අවවාද වලට කන් දී හික්මී සිටිය හැකිය. එහෙත් ඔහුගේ අධ්‍යාපනය අයහපත් නම් ඔබේ අදහස වරදිනු ඇත. අන්තිමේදී ඔහු ඔහුගේම අදහස අනුව ක්‍රියාකරනු ඇත. රට පීඩාවට පත්වනු ඇත. සහතික ලෙස දැනගන්න ඇතරුවා ඇතා කෙරෙහි සැලකිලිමත් නොවුවහොත් අනුන්ගේ ජීවිත පමණක් නොව ඔහුගේම ජීවිතයට ද අනතුරු සිදුවෙයි. රජෙකු තෝරාගැනීමේ දී නුවණ නොමෙහෙයවා ක්‍රියා නොකරන්න. ආගම, රට හා ඔබ රැකබලාගන්නා කෙනෙකු පත්කරගත යුතුය.''[79] යනුවෙනි. මෙම උපදෙස් දීම ලංකාවේ අවසන් පාලකයා තෝරාගැනීම සම්බන්ධ අනාගත වාක්‍යයක් වූ අතර එය එසේම වූ බව ලංකාවේ අවසන් රජු ලෙස සිංහාසනාරූඪ වන ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අධ්‍යයනයෙන් වටහාගත හැකිය.

කෝට්ටේ රාජධානිය බිඳවැටීමත් පෘතුගීසි අගමනයත් සමගින් උදාවන දහසය වන සියවසේ සිට දහ නව වන සියවසේ උදාව දක්වා කාල පරාසය සමස්තයක් වශයෙන් ලංකාවම දේශපාලනික, ආගමික, සංස්කෘතික හා සමාජමය වශයෙන් පසුගාමීත්වයක් සටහන් කරයි. මෙම කාලයේ මුහුදු බඩ පළාත්වල පාලනය විදෙස් ජාතීන් විසින් සිදුකරන අතර ලාංකික පාලනය යටතේ පැවතුනේ රට මැද ප්‍රදේශයන්හි පමණි. පෘතුගීසීහු තම පාලන ප්‍රදේශයන්හි භික්ෂූන් නිර්දය ලෙස පීඩාවට පත්කළහ. ලන්දේසි පාලන සමය තුළ භික්ෂූන් වහන්සේලාට එතරම් බාධාවක් නොතිබුණත් රාජ්‍ය අනුග්‍රහය මදකම නිසා භික්ෂූන් වහන්සේලාගේ සමාජමය බලපෑමේ වර්ධනයක් දැකගත නොහැකි විය. මෙම සියවස් ත්‍රිත්වය අතරින් භික්ෂුව දහ හත්වන සියවසේ දී ප්‍රබලව ඉස්මතු වන ආකාරය දැකගත හැකිවුව ද එකී මතුවීම හරහා රාජ්‍ය පාලන තන්ත්‍රයට සිදුකරන බලපෑම ස්ථිර ස්වභාවයක් නොගනී. කෙසේ නමුත් පැවති සමාජ තත්ත්වයට සාපේක්ෂව භික්ෂුවගේ රාජ්‍ය බලපෑම් ශක්‍යතාවය සහ සමාජ බලපෑම් ශක්‍යතාවය ඉහළ අගයක් ගන්නා බව හඳුනාගත හැකිය.

ආගමික කණ්ඩායමක් ලෙස ආරම්භයේ පටන්ම රාජ්‍ය අනුග්‍රහය යටතේ වර්ධනය වන භික්ෂු සංස්ථාව, කාලීන සමාජ තත්ත්වයන්ට අනුරූපීව අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුරෝගාමියා වෙමින් ලාංකේය සංස්කෘතිය නිර්මාණය කිරීමේ කතෘවරයා වේ. රාජ්‍ය පාලකයා සමග සමීප ඇසුරක් පවත්වමින් ජනතාවට සමීප වෙමින් කටයුතු කළ භික්ෂුවට පාලකයා පත්කිරීමට, වෙනස් කිරීමට, පාලන රටාවට බලපෑම් කිරීමට සහ රටේ ජන චින්තනය පාලනය කිරීමට හැකියාවක් තිබූ බව මෙකී සමය පිළිබඳ අධ්‍යයනිත උක්ත කාරණාවන්ගෙන් පැහැදිලි වේ.

## ආන්තික සටහන්


1. උණ පුණ්ණ සහිත මහාවංසෝ, (උෟ.පු.ම.), සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම: 1959, පරි.58, ගාථා 04; පූජාවලිය, එම, 1930, 782; නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය, සංස්. ගුණවර්ධන නානායක්කාර, කොළඹ. ඇම්.ඩී. ගුණසේන හා සමාගම, 1988, 205; ශාසන වංශය, සංස්, කොත්මලේ සිරි සද්ධම්ම වංශ හිමි, කොළඹ: පී.ඒ කුරේ, බු.ව. 2474, 71.
2. උෟ.පු.ම, පරි.60, ගාථා 22.
3. එම, පරි. 68, ගාථා 304.
4. එම, පරි.76, ගාථා 03.
5. යටදොලවත්තේ ධම්ම විසුද්ධි හිමි, පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්, කොළඹ: කරුණාරත්න සහ පුත්‍රයෝ, 1995, 41.
6. Epihigraphia Zeylanica.Vol.II, D.M.D.Z. Wicramasingha, London: Oxforad University Press, 1928, 265 උෟ.පු.ම, පරි. 76, ගාථා 06.
7. උෟ.පු.ම, පරි. 76, ගාථා 8-11.
8. Epihigraphia Zeylanica.Vol.V,ed: S.Pararanavitana, Colombo: Department of Archaeology, 1955, 44.
9. ඒ.වී. සුරවීර, කතිකාවත් හා භික්ෂු සමාජය, කොළඹ; ඇම්. ඩී ගුණසේන සහ සමාගම, 1971, 82.
10. උෟ.පු.ම, පරි.79, ගාථා 10-16.
11. පූජාවලිය, සංස්. බෙන්තර සද්ධාතිස්ස හිමි, පානදුර: පී. ජේ. කරුණාධාර මුද්‍රණාලය, 1930, 735; උෟ.පු.ම, පරි 79, ගාථා 19 - 22.
12. උෟ.පු.ම, පරි.79, ගාථා 23-39.
13. නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය, එම, 1988, පි. 23.

14. ඒ.වී. සුරවීර, එම, පි. 10; තෙවෙනි විජයබාහු රජු විසින් කතිකාවත් දෙකක් සිදු කරන ලද බව පරණවිතාන මහතා ප්‍රකාශ කළද, යටදොළවත්තේ ධම්මවිසුද්ධි හිමියන් පෙන්වා දෙන්නේ රජු කතිකාවත් දෙකක් සිදු නොකළ බවයි. ''අමුතු කතිකාවතින් සරහා'' යන දඹදෙණි කතිකාවතේ සඳහන් පාඨය මූලික කර ගෙන ස්වකීය තර්කය පරණවිතානයන් ගොඩනගන අතර ධම්මවිසුද්ධි හිමියන් මෙමගින් පොළොන්නරු යුගයේ කරන ලද කතිකාවත පිළිබඳ අදහසක් ගම්‍යමාන කරන බව පවසමින් දඹදෙණියේ විජයබාහු රජු දවස කතිකාවත් දෙකක් නොකළ බව පෙන්වා දෙයි.

15. <u>චූ.පු.ම</u>, පරි.79, ගාථා 40-45.

16. එම, පරි. 79, ගාථා 48-50; <u>පූජාවලිය,</u> 1930, පි. 110.

17. ''අථ රාජන්තරාබ්භ සච්ඡන්ධික විහාරීනං

මිච්ඡාජීව සමාපන්නං සන්තතාසංඤතින්ද්‍රියං''

''සබ්බා ලජ්ජිගණං සම්මා උච්ඡිනිත්වාපනොදි

පරිසුද්ධං සකාරේසි සම්මා සම්බුද්ධ ශාසනං'' <u>චූ.පු.ම</u>, පරි. 82, ගාථා 7-8.

18. ඩී.බී. ජයතිලක, <u>කතිකාවත් සඟරා</u>, කොළඹ: ඇම් ඩී ගුණසේන සහ සමාගම, 1984, 8-25; යටදොලවත්තේ ධම්මවිසුද්ධි හිමි, එම, පි. 63.

19. <u>චූ.පු.ම,</u> පරි. 82, ගාථා 7-10.

20. <u>පූජාවලිය,</u> 1930, පි. 741.

21. <u>චූ.පු.ම</u>, පරි.82, ගාථා 11-16; පූජාවලිය, 1930, පි. 740; දළඳ සිරිත, සංස්.වැලිවිටයේ සෝරත හිමි, කොළඹ: 1955, පි. 15.

22. <u>පූජාවලිය,</u> එම, 1930, පි. 741 ; <u>නිකාය සංග්‍රහය</u> හෙවත් ශාසනාවතාරය, එම, පි. 23.

23. <u>චූ.පු.ම, පරි</u>. 83, ගාථා 32; <u>පූජාවලිය</u>, 1930, පි. 741.

24. එම, පරි. 83, ගාථා 45; <u>පූජාවලිය</u>, 1930, පි. 741.

25. <u>නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය</u>, පි. 24.

26. <u>චූ.පු.ම</u>, පරි.82, ගාථා 25.

27. <u>රාජ රත්නාකරය</u>, සංස්. දවුලදෙන ඥානිස්සර හිමි හා සංස්. සුමනසේකර බණ්ඩා, කොළඹ: රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1990, 117.

28. <u>චූ.පු.ම, පරි</u>. 83, ගාථා 67- 80.

29. එම, පරි.88 ගාථා 82.

30. එම, පරි.88, ගාථා 86,98,99.

31. E.Z.Vol. V, 471.

32. <u>නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය</u>, පි. 24-25; අස්ගිරි තල්පත, සංස්. මැන්දිස් රෝහණදීර, ගංගොඩවිල: විද්‍යෝදය විශ්වවිද්‍යාලය මුද්‍රණාලය, 1969, 07.

33. G. ceodes, Recueil les Inscription, Vol. 1 , Bankok, 1924, P.126.

34. අස්ගිරි තල්පත, 88.

35. එස්. පරණවිතාන, ලංකාවෙන් සියමට වැඩි සංඝරාජයෝ, විද්‍යෝදය වාර්ෂික සංග්‍රහය, 1939, 33 - 41.

36. නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය, 27; සද්ධර්මරත්නාකරය, සංස්. කලපලුවාවේ ධර්මකීර්ති සුගතසාර දේවානන්ද නායක හිමි, කොළඹ: 1955, 317; අස්ගිරි තල්පත, 09.

37. E.Z. Vol. V, P.203.

38. කතිකාවත් සගරා, 50-54

39. ජිනකාලමාලී, සංස්. පි. බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1956, 77.

40. Sasanawmsa, ed. Mablebode, London: 1987, 42.

41. භක්ති ශතකය, සංස්. හැගොඩ ධම්මින්ද හිමි (කොළඹ, 1954), 118.

42. ටිකිරි බණ්ඩා හේරත් අභයසිංහ, පරංගි කෝට්ටේ, ප්‍රකාශන ස්ථානය සඳහන් නොවේ: ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්, 1966, 2. ; එම්. යූ. ද සිල්වා, ''කෝට්ටේ හා සීතාවක රාජධානි'', ශ්‍රී ලාංකේය ඉතිහාසය-111, (සංස්.) ඩබ්ලිව්. එම්. කේ. විජේතුංග, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 2012, 53.

43. F.R. Perniola, The Catholic Church in Cylon, The Porthguese Period, vol.1 .07, 435, 437, 440.

44. Queyroz Fernoa De, The Temporal and Spiritual Conquest of Ceylon, Trans. father S.G. Perera , Madras: 1992, 427.

45. ibid, 67.

46. F.R. Perniola, The Catholic Church in Cylon, The Porthguese Period, vol.11. 434.

47. G.C.Mendis, The Early History of Ceylon,Culcuta: 1935 ,39. ; Epihigraphia Zeylanica. Vol-III,ed: D.M.D.Z. Wicramasingha , London: Oxford University press,1928, 25., no. 152; 32.

48. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, සපරගමු දර්ශනය, රත්නපුර: ශාස්ත්‍රෝදය යන්ත්‍රාලය, 1967, 36.

49. එම, 112.

50. බෙල්ලන්විල විමලරතන හිමි, ''සීතාවක රාජ්‍යයේ සාසනික තොරතුරු'', සීතාවක පුර යුගය, (සංස්.) වේරගැර අරියවංස නායක ස්ථවිර, සංස්කෘතික කටයුතු සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය, 1991, 100.

51. රිසිමන් අමරසිංහ, සීතාවක රාජධානියේ උන්නතියේ ද අවනතියේ ද සමහර අංශ පිළිබඳ විමර්ශනයක්, සීදූව: කතෘ ප්‍රකාශන, 1990, 156.

52. කිරිඇල්ලේ ඥාණවිමල හිමි, සපරගමු දර්ශනය, 112.

53. සැවුල් සන්දේශය, (සංස්.) රපියල් තෙන්නකෝන්, කොළඹ: 1968, 125 කවිය.; සීතාවක හටන, 290 කවිය.

54. මන්දාරම් පුවත, (සංස්.) ලබුගම ලංකානන්ද හිමි, බත්තරමුල්ල: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1996, 88 කවිය.

55. 64.සුගත් සසුන වනසා මිසිදිටු දෙවුය - අතගා නළල සැම සිව සමය ගැන්වුය මිසදිටු නොවූවන් ගිරියේ වැලි ලැවුය - රදල මුදලි දන මිරිකා මෙහෙ ගතුය.

65. මහබෝ වෙහෙර පුද උන් උදුරා ගනිත - සීවත් සඟන මරවන බුදු රූ කඩතපොත් ගිනිලන අනගි විසිතුරු දේ නසත - වැසියන් නසත් උන් සතු දේ හැර ගනිත. මන්දාරම් පුවත, 08.

56. රිස්මන් අමරසිංහ, සීතාවක රාජධානියේ උන්නතියේ ද අවනතියේ ද සමහර අංශ පිළිබඳ විමර්ශනයක්, සීදූව: කතෘ ප්‍රකාශන, 1990, 141-175.

57. සීතාවක ප්‍රබලව පැවති සමයේ කන්ද උඩරට සීතාවකට දිනාදීමට කටයුතු කළ පේරාදෙණියේ විජේසුන්දර බණ්ඩාරගේ පුතාය. විජේසුන්දර බණ්ඩාර තමන්ට විරුද්ධව කැරලි ගසන්නේ යැයි සැක කළ රාජසිංහ ඔහු බොරුවලක දමා මැරවීය. ඉන්පසු කොනප්පු බණ්ඩාර පෘතුගීසීන් වෙත පලාගොස් පෘතුගීසී සේනා සමග කන්ද උඩරටට පැමිණ රාජසංහ බලය උදුරා දමා උපක්‍රමිකව කන්ද උඩරට බලය ලබාගත්තේය.

58. අස්ගිරි තල්පත, (සංස්.) මැන්දිස් රෝහණධීර, නුගේගොඩ: විද්‍යෝදය

විශ්ව විද්‍යාලය, 1969, 14.

59. ඉඳුරාගාරේ ධම්මරතන හිමි, ''සීතාවක යුගයේ ශාසනික තතු'', සීතාවක උරුමය, (සංස්.) ප්‍රිශාන්ත ගුණවර්ධන සහ ගාමිණී අධිකාරී, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009, 268.

60. කොටගම වාචිස්සර හිමි, සරණඞකර සඞසරාජ සමය, ප්‍රකාශන ස්ථානය සඳහන් නොවේ, වයි. දොන් ඇඩ්වින් සහ සමාගම, 1960, 36.

61. ඌ. පූ. ම., පරි.94, ගාථා 15-21.

62. කොටගම වාචිස්සර හිමි, 55.

65. මහාවංශය, බෞද්ධ සංස්කතික මධ්‍යස්ථානය, දෙහිවල:, 146, 176, 448.

63. රොබට් නොක්ස්, එදා හෙළදිව, (පරි.) ඩේවිඩ් කැණරත්න, කොළඹ: ඇම්. ඩී.ගුණසේන සහ සමාගම, 2001, 24.

64. සංඝරාජ සාධු චරියාව, (සංස්.) සුචරිත ගම්ලත්, කොළඹ: ඇස්. ගොඩගේ සහෝදරයෝ, 1996, 26.

65. සඟරජ වත, (සංස්.) චාල්ස් ද සිල්වා, (කොළඹ: 1955, 56-63 කවි.

66. ලෝනා ශ්‍රීමතී දේවරාජ, උඩරට රාජධානිය 1600-1732, පාදුක්කෘ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, 1997, 218.

67. කොටගම වාචිස්සර හිමි, 15.

68. මහාවංශය, <u>බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය</u>, නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2009, 97පරිච්ඡේදය.

69. හුරිකඩුවේ ශ්‍රී රේවත හිමි, සූරියගොඩ <u>සංඝරාජ විහාර වංශය</u>, කඩුගන්නාවේඃ පුංචි බණ්ඩාර රෙජිස්ටාර් නිලමේ, 1955, 10-12.

70. ගොන්සාල්වේස් චරිතය, 17.

71.''දෙවන රාජසිංහ රජ දවස ද ලාහේ නමැති ප්‍රංශ සෙන්පතියා සමග සිරගත කොට සිටි ගැස්කන් නමැති ප්‍රංශ ජාතිකයාට දාව පෘතුගීසි කාන්තාවකට උපන් දරුවා පේද්‍රෝ ගැස්කන් ලෙස හැඳින්වීය. කුඩා කල සිට රජ ගෙදර හැදී වැඩුණු මොහු නරේන්ද්‍රසංහ රජ වී දෙවන අවුරුද්දේ ඇති වූ කැරැල්ලෙන් රජු බේරාගත් බැවින් රජුගේ මාහාධිකාරම් බවට පත්විය. ජෙකබ් ගොන්සාල්වේස් පියතුමා ආදීන් රජුට සමීප කරවීමේ ප්‍රමුඛයා වූයේ මොහුය. විදේශිකයෙකු වීමත් කිතුණුවෙකු වීමත් නිසා බෞද්ධයන්ගේ හා රදළයන්ගේ අප්‍රසාදයට ලක්ව සිටි ගස්කොන්, රජුගේ මෙහෙසිය සමග පෙම් බැඳීමේ වරදට රජු විසින් මරණීය දණ්ඩනය ලබා දුන්නේය. එහෙත් පසුව එය කුමන්ත්‍රණයක ප්‍රතිඵලක් බව ගොන්සාල්වේස් පියතුමා රජුට පැහැදිළි කිරීමෙන් පසුව එම කුමන්ත්‍රණයට සම්බන්ධ සූරියගොඩ හිමියන්ට මරණ දණ්ඩනයත් ලෙව්කේ රාළට සිරදඬුවමුත් නියම විය.'' කොටගම 75. වාචිස්සර හිමි, 262-266.

72. <u>සංඝරාජ සාධු චරියාව,</u> 12.

73. එම, 08.

74. <u>මන්දාරම් පුවත</u>, 510-511, 519-520 කවි.

75. <u>කොටගම වාචිස්සර හිමි</u> 189-190.

76. <u>මොරතොටවත</u>, 48 පද්‍ය.

77. අසදෘශ ජාතක කාව්‍යය, ඩී. පී. ආර්. සමරනායක, 46-64.

78. ලෝනා ශ්‍රීමතී දේවරාජ, 227; ඩේවි, 311-312.